සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2019 ජනවාරි

## (AA31) මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Financial Accounting and Reporting)

2019-01-26
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සිරිවර්ධන,** කේවලස්වාමි ව්‍යාපාරිකයෙක් වන අතර, ඔහුගේ තොග වෙළෙඳ ව්‍යාපාරය 2016 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඔහුගේ ව්‍යාපාරයේ ශුද්ධ වත්කම්, 2017 අප්‍රේල් 01 දිනට රු. මිලියන 3.2 ක් වූ අතර, 2018 මාර්තු 31 දිනට එය රු. මිලියන 4.5 ක් විය. 2018 මාර්තු 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළදී ඔහු විසින් රු. මිලියන 0.5 ක ගැනිලි සිදුකර තිබුණි. තවද, සළකා බැලූ වර්ෂය තුළදී, ඔහු විසින් විටින් විට අමතර ප්‍රාග්ධනය වශයෙන් රු. මිලියන 1 ක මුළු මුදලක් ව්‍යාපාරයට යොදවා තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ලාභය ගණනය කිරීමට අදාලව, මූල්‍ය ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්පය, භෞතික ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්පයෙන් **වෙනස්කොට දක්වන්න.** (ලකුණු 03)

(b) මූල්‍ය ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්පයට අනුව **සිරිවර්ධනගේ** ව්‍යාපාරයේ ඉපැයූ ලාභය **ගණනය කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

තිරසාරත්ව වාර්තාකරණය (sustainability reporting) තුළින් කිසියම් සංවිධානයකට ඔවුන්ගේ ක්‍රියාපටිපාටීන් තුළින් පැන නගින තිරසාරත්වය පිළිබඳ ගැටළු කෙරෙහි සළකා බැලීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙනවාසේම ඔවුන් විසින් මුහුණ දෙනු ලබන අවදානම් සහ අවස්ථාවන් පිළිබඳව වඩාත් විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීමට ද හැකියාව ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "තිරසාරත්ව වාර්තාව" යනු කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) තිරසාරත්ව වාර්තාකරණයේ ප්‍රතිලාභ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත සෞභාග්‍යා හෝල්ඩින් (පෞද්ගලික) සමාගමේ** ගණකාධිකාරිවරයා වන **පුණ්‍යසිරි මහතා**, පහත සඳහන් සිද්ධීන්ට මුහුණදෙන ලදී:

(a) **සීමාසහිත සෞභාග්‍යා හෝල්ඩින් (පෞද්ගලික) සමාගම,** වර්ෂයේ අවසාන දිනය වන 2018 මාර්තු 31 දින ඔවුන්ගේ ප්‍රධාන ගනුදෙනුකරු වෙත රු. මිලියන 7.5 ක් වටිනා භාණ්ඩ ඉන්වොයිස් කර තිබුණි. නමුත් 2018 අප්‍රේල් 10 දින වනතෙක් එම අයිතමයන් අදාල ගනුදෙනුකරු වෙත බාරදී නොතිබුණි.

(b) **සීමාසහිත රිලායන්ස් බැන්ක් පොදු සමාගමේ** කොටස්හි කර තිබූ ආයෝජන වෙනුවෙන් රු. මිලියන 2.7 ක ලාභාංශයක්, 2018 අප්‍රේල් 20 දින සමාගම වෙත ලැබුණි. කෙසේවෙනත් ලාභාංශ සඳහා කොටස්හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් වූ **සීමාසහිත රිලායන්ස් බැන්ක් පොදු සමාගමේ,** මහා සභා රුස්වීම පවත්වන ලද්දේ 2018 මාර්තු 30 දිනයි.

(c) **සීමාසහිත සෞභාග්‍යා හෝල්ඩින් (පෞද්ගලික) සමාගම,** සේවා සැපයීම වෙනුවෙන් **සීමාසහිත පෙරේරා සමාගම** සමඟ වසර 4 ක කාලයක් සඳහා වූ සේවා ගිවිසුමකට 2017 අප්‍රේල් 01 දින එළඹිණි. වසර 4 ක කාලපරිච්ඡේදය සඳහා මූලික සේවා ගාස්තුව රු. මිලියන 01 ක් වූ අතර, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු.150,000/- ක පිරිවැයක් දරණ ලදී. රු.450,000/- ක පිරිවැයක් මීළඟ වර්ෂ 03 ක කාලය තුළදී දැරීමට නියමිතය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 - අයභාරය අනුව, ඉහත එක් එක් සිද්ධිය 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී අයභාරය ලෙස හඳුනාගත යුතුද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත ටෝකියෝ ට්‍රේඩිං සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය පහත පරිදි වේ:

**සීමාසහිත ටෝකියෝ ට්‍රේඩිං සමාගම**
**2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය**

| | **රු.** |
|---|---:|
| විකුණුම් | 760,000 |
| විකුණුම් පිරිවැය | (643,000) |
| **දළ ලාභය** | **117,000** |
| වෙනත් ආදායම් - ආයෝජන ආදායම් | 850 |
| බෙදාහැරීමේ වියදම් | (30,000) |
| පරිපාලන වියදම් | (32,000) |
| මූල්‍ය වියදම් | (6,500) |
| **බදු පෙර ලාභය** | **49,350** |

2018 මාර්තු 31 සහ 2017 මාර්තු 31 යන දිනවලට **සීමාසහිත ටෝකියෝ ට්‍රේඩිං සමාගමේ** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලද ශේෂ පහත පරිදි වේ:

| | **2018 මාර්තු 31 දිනට (රු.)** | **2017 මාර්තු 31 දිනට (රු.)** |
|---|---:|---:|
| තොගය | 132,000 | 125,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 205,000 | 218,000 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 142,000 | 135,000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 3,500 | 2,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ක්ෂයවීම් රු.12,500/- කි.

(2) මූල්‍ය වියදම්වලින් නිරූපණය වන්නේ ණයකරහිමියන් වෙත ගෙවන ලද පොලියයි.

(3) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් බදු වියදම රු.8,000/- කි.

(4) සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදුකරන ලදී.

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ටෝකියෝ ට්‍රේඩිං සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහ, <u>ඍජු ක්‍රමය</u> යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත එකෝ ප්‍රොටෙක්ට් ලංකා (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 සහ 2017 මාර්තු 31 දිනයන්ට / දිනෙන් අවසන් වර්ෂ සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

**සීමාසහිත එකෝ ප්‍රොටෙක්ට් ලංකා (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය ප්‍රකාශනවල උද්ධෘතයන්** *(රු.'000)*

| **දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
|---|---:|---:|
| පිරිවැටුම | 220,650 | 199,500 |
| විකුණුම් පිරිවැය | 147,835 | 137,655 |
| දළ ලාභය | 72,815 | 61,845 |
| පොලී සහ ආදායම් බදුවලට පෙර ලාභය | 17,750 | 18,220 |
| වර්ෂය සඳහා වූ ලාභය | 15,620 | 15,820 |
| **දිනට** | **2018 මාර්තු 31** | **2017 මාර්තු 31** |
| තොග | 12,200 | 10,550 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 28,200 | 22,500 |
| කොටස්හිමියන්ගේ ස්කන්ධය | 121,030 | 105,410 |
| බැංකු ණය | 9,950 | 10,350 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | 100,000 | 100,000 |

පහත සඳහන් කර්මාන්ත සාමාන්‍යයන් ද (industry averages) හඳුනාගෙන ඇත:

| | |
|---|---:|
| දළ ලාභ අනුපාතය | 40% |
| ශුද්ධ ලාභ අනුපාතය | 12% |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ROCE) | 8% |
| තොග පිරිවැටුම් අනුපාතය | වාර 10 |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | වාර 9 |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 40 |

සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරන ලද බවත් වර්ෂයට අදාලව වෙනත් කිසිදු විස්තීර්ණ ආදායමක් නොවූ බවත් උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත හඳුනාගන්නා ලද කර්මාන්ත සාමාන්‍යයන් සැලකිල්ලට ගනිමින්, **සීමාසහිත එකෝ ප්‍රොටෙක්ට් ලංකා (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න**.

(ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සියැස්ටෝ ක්‍රියේෂන්ස් (පෞද්ගලික) සමාගමේ** 2017 මාර්තු 31 දිනට සහ 2018 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල සහ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතයන් පහත දැක්වේ:

**සීමාසහිත සියැස්ටෝ ක්‍රියේෂන්ස් (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2018 | 2017 |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට | 4,740 | 4,300 |
| සමුච්චිත ක්ෂයවීම් | (2,060) | (1,410) |
| **ධාරණ අගය** | **2,680** | **2,890** |
| | | |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 2,370 | 1,415 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 4,450 | 2,536 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,280 | 1,320 |
| | **9,100** | **5,271** |
| **මුළු වත්කම්** | **11,780** | **8,161** |
| | | |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 2,000 | 2,000 |
| රඳවාගත් ඉපැයීම් | 3,660 | 1,460 |
| | **5,660** | **3,460** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 1,000 | - |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 590 | 500 |
| විලම්භිත බදු වගකීම් | 720 | 500 |
| | **2,310** | **1,000** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 2,760 | 2,851 |
| ගෙවිය යුතු ආදායම් බදු | 1,050 | 850 |
| | **3,810** | **3,701** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **11,780** | **8,161** |

**2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය**

| | **රු.'000** |
|---|---|
| පොලී සහ ආදායම් බදු පෙර ලාභය | 2,900 |
| පොලී වියදම් | (250) |
| **ආදායම් බදු පෙර ලාභය** | **2,650** |
| ආදායම් බදු | (450) |
| **වර්ෂයට අදාල ලාභය** | **2,200** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂයට අදාල ආදායම් බදු තුළ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල විලම්බිත බදු වියදම ද අන්තර්ගත වේ.

(2) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සමාගම විසින් රු.550,000/- ක් පිරිවැය වූ උපකරණයක් රු.400,000/- ක මුදලකට ඉවත් කරන ලදී. ඉවත් කරන ලද දිනට උපකරණයේ ධාරණ අගය රු.200,000/- ක් විය.

(3) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් කිසිදු විස්තීර්ණ ආදායමක් නොතිබුණි. තවද, වර්ෂය අවසන් දිනට උපචිත පොලී වියදම් කිසිවක් නොතිබුණි.

(4) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පාරිතෝෂික ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත සියැස්ටෝ ක්‍රියේෂන්ස් (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය <u>වක්‍ර ක්‍රමය</u> යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(A) **KEL කල්බදු සමාගම (KEL)** 2017 ජනවාරි 01 දින වසර 5ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ **පෙරේරාට** මෝටර් රථයක් විකුණන ලදී. මෝටර් රථයේ අත්පිට විකුණුම් මිල රු. මිලියන 2.5 ක් විය. 17% වාර්ෂික කල්බදු පොලියකට යටත්ව රු.781,409.75 ක් වූ වාර්ෂික කල්බදු වාරිකය සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දින ගෙවිය යුතු විය. **පෙරේරා** විසින් කල්බදු වාරික නියමිත දිනයන්හිදී ගෙවන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 දෙසැම්බර් 31 දිනට / දිනෙන් අවසන් වර්ෂය සඳහා, **KEL** හි පොත්වල දැක්වෙන පහත ගිණුම් **පිළියෙල කරන්න**:

(a) කල්බදු ණයගැති ගිණුම.

(b) නොඉපයූ මූල්‍ය ආදායම් ගිණුම. (ලකුණු 06)

(B) **සීමාසහිත රිලායන්ස් පාට්නර්ස් (පෞද්ගලික) සමාගම (RPL),** සබන් නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපාරික ආයතනයකි. **RPL** හි 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, නිකුත් කිරීම සඳහා 2018 මැයි 10 දින, අනුමැතිය ලබා දෙන ලදී.

පහත සඳහන් තොරතුරු **RPL** සමාගමට අදාල වේ:

(1) පසුගිය වර්ෂයේ සිට තොගවලට අදාලව මූල්‍ය කළමනාකරු සහ ගබඩා කළමනාකරු විසින් සාමූහිකව සිදුකරන ලද වංචාවක් 2018 මැයි 05 දින අනාවරණය විය. මෙම වංචාව හේතුකොටගෙන රු. මිලියන 35.5 ක අලාභයක් සිදුවී ඇති බවත් තොග වටිනාකම ඒ හා සමාන වූ වටිනාකමකින් අධිතක්සේරු වී ඇති බවත් ඇස්තමේන්තුගත කර ඇත.

(2) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ජනිත වූ ලාභය මත සේවකයන් සඳහා ගෙවීමට රු. මිලියන 4 ක කාර්යසාධන දීමනාවක් **RPL** හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 අප්‍රේල් 15 දින අනුමත කරන ලදී. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙය සැලකිල්ලට ගෙන නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් අනුව, ඉහත එක් එක් සිදුවීම 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ **RPL** හි මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලබන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ග්‍රීන් ගාඩ්න් පොදු සමාගම,** කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගමකි. 2018 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

**සීමාසහිත ග්‍රීන් ගාඩ්න් පොදු සමාගම**

**2018 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය - කොටස් 2,000,000 | | 40,000 |
| 2017 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 2,500 |
| **දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට):** | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ වටිනාකම - රු. මිලියන 20) | 30,000 | |
| මෝටර් වාහන | 10,000 | |
| කාර්යාල උපකරණ | 3,500 | |
| **2017 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිලි | | 6,000 |
| මෝටර් වාහන | | 2,000 |
| කාර්යාල උපකරණ | | 950 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 600 | |
| 2018 මාර්තු 31 දිනට තොගය (පිරිවැයට) | 25,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 62,000 | 45,000 |
| 2017 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 700 |
| උපචිත වියදම් | | 1,000 |
| 2016/17 තක්සේරු වර්ෂයට අදාලව ගෙවිය යුතු ආදායම් බදු | | 1,200 |
| බැංකු ණය | | 3,000 |
| අතැ'ති මුදල් සහ බැංකුවේ මුදල් | 200 | |
| බැංකු අයිරාව | | 300 |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 174,500 | 262,500 |
| සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 1,000 | |
| පරිපාලන වියදම් | 20,200 | |
| බෙදාහැරීමේ වියදම් | 26,500 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 1,850 | |
| මූල්‍ය වියදම් | 3,800 | |
| ගෙවූ ආදායම් බදු | 6,000 | |
| | **365,150** | **365,150** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) ගනුදෙනුකරුවෙකුට භාණ්ඩ බෙදාහරින අතරතුර 2017 ජූනි 30 දින අනතුරකට ලක්වූ බෙදාහැරීමේ ලොරි රථයක්, 2017 ඔක්තෝම්බර් 31 දින සමාගම විසින් රු.200,000/- ක මුදලකට ඉවත් කරන ලදී. ලොරි රථය රු. මිලියන 1.2 ක මුදලකට මිලදීගෙන තිබුණු අතර, 2017 අප්‍රේල් 01 දිනට එහි සමුච්චිත ක්ෂය රු.600,000/- ක් විය. සිදු වූ හානිය වෙනුවෙන් ලොරි රථයේ ගැනුම් මිලෙන් ¼ කට සමාන ප්‍රමාණයක් සමාගමට රක්ෂණ වන්දිය වශයෙන් හිමිවිය. ලැබූ රක්ෂණ වන්දිය සහ ලොරි රථය ඉවත් කිරීමෙන් ලද මුදල යන දෙකම විකුණුම් ගිණුමට බැර කර ඇත. මේ හැර ලොරි රථය ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොතිබුණි.

(2) 2017 ජූනි 01 දින, රු. මිලියන 1.5 ක් වටිනා නව පරිගණක මෘදුකාංගයක් සමාගම විසින් මිලට ගන්නා ලදී. අදාල මෘදුකාංගය සමාගමේ ව්‍යාපාරික කටයුතුවලට අදාල වන පරිදි සංවර්ධනය කිරීම සඳහා එදිනම රු.300,000/- ක අමතර වියදමක් ද සමාගම විසින් දරණ ලදී. පරිගණක මෘදුකාංගයේ ගැනුම් මිල සහ සංවර්ධනය කිරීමේ පිරිවැය යන දෙකම ගැනුම් ගිණුමේ වාර්තා කර තිබුණි.

(3) 2017 ඔක්තෝම්බර් 01 දින ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සමාගම විසින් රු.3,000,000/- ක ණයක් ලබාගත් අතර, එදිනම ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ වැඩකටයුතු ද ආරම්භ කරන ලදී. 2018 මාර්තු 31 දිනට ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.600,000/- ක පිරිවැයක් දරා තිබූ අතර, එය ප්‍රාග්ධන නොනිම් වැඩ ලෙස වර්ගීකරණය කර තිබුණි. ණය මුදලට අදාල වාර්ෂික පොලී අනුපාතිකය 12% කි. වර්ෂය තුළදී මෙම ණය මුදලට අදාලව නැවත ගෙවීම් කිසිවක් සිදුකර නොමැති අතර, ණය මුදල මත ප්‍රවර්තන වර්ෂයට අදාල පොලිය, මූල්‍ය වියදම්වලට හර කර උපචිත වියදම්වලට බැර කර තිබුණි.

(4) දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීව කාලය පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 20 |
| මෝටර් වාහන | : | වර්ෂ 05 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 05 |
| පරිගණක මෘදුකාංග | : | වර්ෂ 03 |

(5) 2018 මාර්තු 31 දිනට පැවති තොගයෙන් රු.500,000/- ක් පිරිවැය වූ තොග යල්පැන ඇතැයි අනාවරණය වූ අතර, එය 2018 අප්‍රේල් 30 දින රු.100,000/- ක මුදලකට විකුණන ලදී.

(6) 2018 මාර්තු 31 දිනට සමාගමට රු.2,000,000/- ක මුදලක් අයවිය යුතුව තිබූ ණයගැතියෙක් 2018 මැයි 05 දින බංකොලොත්භාවයට පත්විය. එමනිසා ඔහුගෙන් අයවිය යුතුව තිබූ සම්පූර්ණ මුදලම නැවත අයකරගත නොහැකි තත්ත්වයට පත්විය. තවද, 2018 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් වෙනුවෙන් 5% ක පොදු වෙන්කිරීමක් ද සිදුකළ යුතුව ඇත.

(7) 2017/18 වර්ෂය තුළදී සමාගමේ ගනුදෙනුකරුවෙක් සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. මේ සඳහා වූ නඩුවේ තීන්දුව 2018 මැයි 05 දින ලබා දී ඇති අතර, ඒ අනුව රු.260,000/- ක වන්දියක් එම ගනුදෙනුකරුට ගෙවීමට සමාගමට සිදුවිය.

(8) 2018 අප්‍රේල් මාසයට අදාල රක්ෂණ ගෙවීම වූ රු.110,000/-, රක්ෂණ වියදම් තුළ ඇතුලත් කර ඇති අතර, එය පරිපාලන වියදම් යටතේ වාර්තාකර තිබුණි.

(9) 2017/18 තක්සේරු වර්ෂයට අදාල සමාගමේ ආදායම් බදු වගකීම රු.6,500,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(10) 2018 අප්‍රේල් 30 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී 2018 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු.1/- ක අවසාන ලාභාංශයක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කර ඇත.

(11) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මැයි 30 දින, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

ඉහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ග්‍රීන් ගාඩ්න් පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 07)

(c) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(A) 2018 මාර්තු 31 දිනට **සීමාසහිත ඉන්ඩොකෙම් පොදු සමාගමේ (ICL)** සහ **සීමාසහිත ටකසාගෝ (පෞද්ගලික) සමාගමේ (TL)** පහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන උපුටාගෙන ඇත:

**2018 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | ICL | TL |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ – පිරිවැයට | 55,000 | 15,000 |
| සමුච්චිත ක්ෂය | (12,000) | (6,000) |
| ධාරණ අගය | 43,000 | 9,000 |
| TL හි ආයෝජනය | 25,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 20,100 | 20,500 |
| TL වෙත ලබා දී ඇති කෙටිකාලීන ණය | 5,500 | - |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 34,750 | 10,500 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 6,500 | 4,600 |
| **මුළු වත්කම්** | **134,850** | **44,600** |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 82,000 | 20,000 |
| රඳවාගත් ඉපැයීම් | 15,750 | 6,700 |
| **ජංගම නොවන වගකීම්:** | | |
| බැංකු ණය | 10,200 | - |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 13,100 | 8,000 |
| බැංකු ණය | 5,200 | - |
| ICL මඟින් ලබාගත් කෙටි කාලීන ණය | - | 5,500 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | 8,600 | 4,400 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **134,850** | **44,600** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) **ICL සමාගම, TL සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් 2017 අප්‍රේල් 01 දින රු. මිලියන 25 ක මුදලකට අත්පත් කරගෙන ඇත.

(2) අත්පත් කරගන්නා ලද දිනට පාලනය නොවන හිමිකමේ සාධාරණ අගය රු. මිලියන 4.42 ක් විය. අත්පත් කරගන්නා ලද දිනට, රඳවාගත් ලාභය, රු. මිලියන 2.1 ක් වූ අතර, **TL සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය ඒවායෙහි පොත් අගයට සමාන විය.

(3) 2018 මාර්තු 31 දිනට, **TL සමාගමෙහි** පැවති තොගයෙහි **ICL සමාගමෙන්** මිලදීගත් රු. මිලියන 3 ක වටිනාකමක් සහිත තොග නොවිකිණී ඉතිරිව පැවතිණි. **ICL සමාගම** විසින් **TL සමාගමට** විකුණුම් මිලෙන් 20% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ විකුණා තිබුණි.

(4) **TL සමාගම,** 2017 අප්‍රේල් 01 දින 15% වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ **ICL සමාගමෙන්** රු. මිලියන 5.5 ක ණය මුදලක් ලබාගන්නා ලදී. වර්ෂයට අදාල පොලිය ගෙවා ඇති අතර, ප්‍රාග්ධන ආපසු ගෙවීම් කිසිවක් වර්ෂය තුළදී සිදුකර නොමැත.

(5) ICL සමාගමේ වෙළෙඳ ලැබිය යුතු මුදල් හි TL සමාගමෙන් ලැබිය යුතු රු. මිලියන 2.5 ක් ඇතුලත් විය. **TL සමාගම** රු. මිලියන 1 ක වටිනාකමට චෙක්පතක් ලියා එය **ICL සමාගම** වෙත යවන ලදී. 2018 මාර්තු 31 දිනය වන විටත් එම චෙක්පත **ICL සමාගම** වෙත ලැබී නොතිබුණි.

(6) **ICL සමාගමේ** රඳවාගත් ඉපැයීම් තුළ 2018 මාර්තු 01 දින **TL සමාගමෙන්** ලද රු. මිලියන 1 ක අතුරු ලාභාංශයක් ඇතුලත් වේ. වර්ෂයේ ලාභය පදනම් කරගනිමින් **TL සමාගම** විසින් ලාභාංශ ගෙවා තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී පැන නගින කීර්තිනාමය **ගණනය කරන්න.** (ලකුණු 05)

(b) 2018 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 14)

(B) **සීමාසහිත ඉන්ඩොකෙම් පොදු සමාගම (ICL)** සහ **සීමාසහිත ටකසාගෝ (පෞද්ගලික) සමාගමට (TL)** අදාලව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් අමතර තොරතුරු ද උපුටාගන්නා ලදී:

| | **ICL (රු.'000)** | **TL (රු.'000)** |
|---|---:|---:|
| විකුණුම් | 175,000 | 89,000 |
| ගැනුම් | 64,000 | 36,000 |

(1) ණයට ගැනුම්, මුළු ගැනුම්වලින් 80% කි.

(2) 2017 මාර්තු 31 දිනට **ICL සමාගමේ** සහ **TL සමාගමේ** වෙළෙඳ ගෙවිය යුතු මුදල් පිළිවෙලින් රු. මිලියන 12 ක් සහ රු. මිලියන 6 ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සමාගම් දෙකටම අදාලව පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(a) ජංගම වත්කම් අනුපාතය.

(b) තෝලන අනුපාතය.

(c) ණයහිමි පිරිවැටුම් අනුපාතය. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |